**ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම - 2016**

-------------------------------------------------------

ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ මුල් මාස හයට අදාලව මූලික සටහන්වල විධිමත් වාර්තා සහ උපකාරක ලේඛණ නඩත්තු නොකිරීම හේතුවෙන් එම ගනුදෙනු පරීක්ෂා කිරීමට නොහැකිවුණි. තවද එම කාලපරිච්ජේදයටම අදාළව පොදු ලෙජර් ගිණුම් ද විධිමත්ව තුලනය කර නොතිබුණි.

(ආ) කුමපඅ සඳහා ශ්‍රී ලංමුවාප්‍ර හි 17.19 වගන්තියේ නිර්දේශ කර ඇති පරිදි 2016 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.782,574 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය කිරීමකින් තොරව අඛණ්ඩව භාවිතා කර තිබුණි.

(ඇ) 2016 මාර්තු සිට මෙහෙයුම් කටයුතු නවතා දමන ලද සඟරා මුද්‍රණය කිරීමෙන් ජනිත වූ රු.4,374,033 ක අලාභය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව හෙළිදරව් කර නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇති වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කුමපඅ සඳහා ශ්‍රීලංමුවප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තිය ප්‍රකාර සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩුවන විට වැඩ කරන දින විස්සක් ඇතුළත දී, කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවා නොතිබුණි.

### 2.3 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

--------------------------------

2016 ජුලි 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ නම "බිස්නස් ලංකා ඒඑන් (පුද්ගලික) සමාගම "වෙනුවට" ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම" නමින් වෙනස්කර තිබුණු අතර ඊට අනුරූපීව එහි අරමුණු ද, සඟරා මුද්‍රණය වෙනුවට මව් සමාගමේ අභ්‍යන්තර සහ බාහිර උත්සව සංවිධානය කිරීම සහ බාහිර දැන්වීම් ව්‍යාපාර සිදුකිරීම වශයෙන් නව සැලසුම් සකස්කර තිබුණි. කෙසේවුවද, සමාගම අඛණ්ඩ ව්‍යාපාර පාඩු ලැබීම, සෘණ කාරක ප්‍රාග්ධන සහ සෘණ නුබුන්වත් ආන්තිකයන්ගෙන් පැවතුණි. 2014 වර්ෂයේ සිට සමාගමේ කාරක ප්‍රාග්ධනය සහ නුබුන්වත් ආන්තිකය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තර | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ජංගම වත්කම් | 1,395,833 | 5,420,500 | 10,801,514 |
| <u>අඩුකළා</u> | | | |
| ජංගම වගකීම් | (17,981,100) | (15,839,148) | (11,171,273) |
| **කාරක ප්‍රාග්ධනය** | **(16,585,267)** | **(10,418,648)** | **(369,759)** |
| ශුද්ධ වත්කම් | (16,433,502) | (9,740,116) | 835,542 |
| <u>අඩුකළා</u> | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | (3,000,000) | (3,000,000) | (3,000,000) |
| **නුබුන්වත් ආන්තිකය** | **(19,433,502)** | **(12,740,116)** | **(2,164,458)** |

කෙසේවුවද, සමාගමේ සභාපති ඔහුගේ 2017 නොවැම්බර් 16 දිනැති ලිපියෙන්, ඈවර කිරීමට හෝ ව්‍යාපාරවල නිරතවීම නවතා දැමීමට කළමනාකරණයේ එවැනි සැලැස්මක් නොමැති බව සහ මව් සමාගම විසින් සමාගමට අඛණ්ඩව මූල්‍ය සහාය ලබාදෙන බවට මා වෙත වාර්තා කර තිබුණි.

**2.4 මූල්‍ය කළමනාකරණය**

සමාගමේ වියදම් ආවරණය කර ගැනීම වෙනුවෙන් 2016 අගෝස්තු සිට දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා මව් සමාගම විසින් රු.1,500,000 ක අමතර මුදලක් ලබාදී තිබුණි. කෙසේවුවද, එකී කාලපරිච්ඡේදය තුළදීම එම වටිනාකමින් රු.485,595 ක මුදලක් කිසිදු කාර්යයන් සඳහා උපයෝජනය කිරීමකින් තොරව ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවා තිබුණි. පසුව එම මුදලින් රු.467,000 ක ප්‍රමාණයක් 2016 දෙසැම්බර් 31 දින දී මව් සමාගම වෙත ප්‍රේෂණය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,693,385 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.10,575,658 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,882,273 ක වර්ධනයක් දක්නට ලැබුණි. පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රු.2,861,985 ක් සහ රු.2,923,885 ක් වශයෙන් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට බලපෑ ප්‍රධාන හේතුව වී තිබුණි.

2015 සහ 2016 වර්ෂ සඳහා වැටුප්, බදු සහ ක්ෂය අය කිරීම් සැලකිල්ලට ගැනීමෙන් පසු, සමාගමේ අගය එකතු කිරීම පිළිවෙලින් රු.5,194,890 ක් සහ රු.2,850,944 ක් ලෙස සෘණ අගයන් වාර්තා කර තිබුණි. කෙසේවුවද, පසුගිය වර්ෂය සමග සැසඳීමේදී, සමාලෝචිත වර්ෂයේදී අගය එකතු කිරීම සියයට 45 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 මෙහෙයුම් දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල රු.1,588,259 ක ආදායමක් උපයා තිබුණ ද, වැටුප් සහ වේතන වශයෙන් රු.3,453,643 ක් ගෙවා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායමෙන් එය සියයට 217 ක් නියෝජනය කර තිබුණි.

(ආ) විධිමත් ණය අයකර ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැතිවීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති අඩමාන ණය කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.15,542,704 ක් වූ අතර එම ප්‍රමාණයෙන් රු.14,456,255 ක් හෙවත් සියයට 93 ක් සඳහා බොල් හා අඩමාන ණය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඇ) මව් සමාගම විසින් සමාගමේ වියදම් ආවරණය කරගැනීම සඳහා මූල්‍ය සහාය ලබා දී තිබුණි. එම නිසා, 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ හිඟව පැවති රු.17,297,969 ක වියදම් මව් සමාගම විසින් පියවා දමා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්ම අස්තිත්වයේ අනාගත කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකරණයේ කැපවීම පිළිබිඹු කිරීමකි. කෙසේවුවද, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි වගන්ති 5 අනුව, සමාගම ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 විගණන කමිටු**

අස්තිත්වයට ප්‍රමාණවත් බලපෑමක් ඇති කරන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුදුසු කණ්ඩායමක් සහිතව කමිටු පත්කිරීම කළමනාකරණයේ වගකීමකි. කෙසේවුවද, අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය කටයුතු සඳහා නිර්දේශ සහිතව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම වෙනුවෙන් අවම වශයෙන් මාස තුනකට වරක් ක්‍රමවත්ව රැස්වෙන පරිදි විගණන කමිටුවක් පත්කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ප්‍රාථමික සටහන්වල විධිමත් පොත්පත් සහ ආධාරක ලිපිලේඛණ පවත්වාගෙන යාම |
| | | - | ලෙජර් ගිණුම් තුලනය කිරීම |
| (ආ) | ණයගැති කළමනාකරණය | - | විධිමත් ණය අයකර ගැනීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම |
| (ඇ) | වියදම් පාලනය | - | වැටුප් හා වේතන ගෙවීම් අඩුකර ආදායම් වැඩිකිරීම |
| (ඈ) | කාරක ප්‍රාග්ධන කළමනාකරණය | - | කෙටිකාලීන වගකීම් ගෙවා දැමීම සඳහා මෙහෙයුම් මුදල් ප්‍රවාහ වැඩිකිරීම |